# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2306/10 - 2022 නොවැම්බර් මස 14 වැනි සඳුදා - 2022.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 වූ අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II වැනි තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතයවන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතුයැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 11-0133



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## යටියන්තොට නාගරික බල ප්‍රදේශයේ සීමා මායිම් පුළුල් කිරීම

*උපලේඛනය*

***I තීරුව***

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 106 යටියන්තොට, අංක 106 ඒ පරුස්සැල්ල, අංක 106බී කබළුමුල්ල, අංක 106සී මහවිල, අංක 108 මත්තමගොඩ, අංක 115සී ගරාගොඩ පහළ, අංක 115ඩී ගරාගොඩ ඉහළ, අංක 133 ගෝනගමුව, අංක 133ඒ තැලිගම, අංක 133බී නෙළුවතුකන්ද, අංක 134 කිතුල්ගල උතුර, අංක 134ඒ මහබාගේ, අංක 134සී මල්වත්ත, අංක 134ඩී කළුකොහුතැන්න, අංක 134ඊ දුනුකේදෙණිය, අංක 134 එෆ් කිරිකොහුතැන්න, අංක 135 ගනේපල්ල, අංක 135ඩී නවට, අංක 135ඊ හක්බෙල්ලාවක යන ග්‍රාම නිලධාරි වසම්වලින් සමන්විත වූ ද මෙහි දෙවන තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

***II තීරුව***

*උතුර :*

යටියන්තොට නාගරික බල ප්‍රදේශයට අයත් අංක 107බී ගල්පාත ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම, අංක 106බී කබුළුමුල්ල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඡේදනය කරන ලක්ෂය ආරම්භක ලක්ෂය ලෙස ගෙන එතැන් සිට එකී කබුළුමුල්ල ග්‍රාම නිලධාරි වසමේ මායිම ඔස්සේ ඊසාන දෙසට ඇදී රේඛාව තවදුරටත් එම වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දිශානුගතව අංක 106 සී මහවිල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඡේදනය කරන ලක්ෂය තෙක් ද, එතැන් සිට එකී වසම් මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව අංක 106ඒ පරුස්සැල්ල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඡේදනය කරන ලක්ෂය තෙක් ද, එතැන් සිට එකී පරුස්සැල්ල ග්‍රාම නිලධාරි වසම් මායිම් ඔස්සේ උතුර, නැගෙනහිරට, දකුණ, ඊසාන, ගිණිකොන හා බටහිර දිශානුගතව අංක 135ඩී නවට ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂය තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසම් මායිම ඔස්සේ ගිණිකොන දිශානුගතව අංක 135ඊ හක්බෙල්ලාවක ග්‍රාම නිලධාරි වසමේ උතුරු සීමා මායිම ඡේදනය කරන ලක්ෂය තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසම් මායිම් ඔස්සේ නැගෙනහිර දිශානුගතව අංක 135 ගනේපල්ල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය තෙක් ද, එතැන් සිට එකී මායිම ඔස්සේ ඊසාන හා ගිණිකොන දිශානුගතව අංක 133 ගෝනගමුව ග්‍රාම නිලධාරි වසමෙහි උතුරු මායිම හමුවන ලක්ෂය තෙක් ද, එතැන් සිට එකී වසම් මායිම් ඔස්සේ ඊසාන දිශානුගතව අංක 133බී නෙළුවතුකන්ද ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂය තෙක් ද, එතැන් සිට එකී වසම් මායිම ඔස්සේ වයඹ, ඊසාන හා නැගෙනහිර දිශානුගතව ඇදි රේඛාව අංක 134එෆ් කිරිකොහුතැන්න ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට තවදුරටත් එකී මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව අංක 134සී මල්වත්ත ග්‍රාම නිලධාරි වසමෙහි උතුරු මායිම හමුවන ලක්ෂය තෙක් ද එතැන් සිට එකී වසම් මායිම් ඔස්සේ ඊසාන හා ගිණිකොන දිශානුගතව අංක 134ඊ දුනුකේදෙණිය ග්‍රාම නිලධාරි වසමෙහි බටහිර මායිම ඡේදනය කරන ලක්ෂය තෙක් ද, එතැන් සිට එකී වසම් මායිම ඔස්සේ නැගෙනහිර දෙසට හා ඊසාන දිශානුගතව හා ගිණිකොන දිශානුගතව අංක 134ඒ මහබාගේ ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය තෙක් ද එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසම් මායිම් ඔස්සේ ගිණිකොන දිශානුගතව ඇදි රේඛාව සබරගමුව පළාත හා මධ්‍යම පළාත වෙන්වන මායිම ඡේදනය කරන ලක්ෂය තෙක් ද;

*නැගෙනහිර :*

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට එකී මධ්‍යම පළාත් මායිම ඔස්සේ දකුණු හා ගිණිකොන දිශානුගතව නුවරඑළිය දිස්ත්‍රික් මායිම ඡේදනය කරන ලක්ෂය තෙක් ද, එතැන් සිට එකී දිස්ත්‍රික් මායිම ඔස්සේ නිරිත, බටහිර හා නැවත නිරිත දිශානුගතව අංක 134බී කිතුල්ගල දකුණ ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම් ඡේදනය කරන ලක්ෂය කැලණි ගඟේ මධ්‍යම රේඛාව හමුවන ලක්ෂය තෙක් ද,

| I තීරුව | II තීරුව |
|---|---|
| | *දකුණ :* |
| | අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට කැලණි ගගේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර හා වයඹ දිශානුගතව අංක 106 යටියන්තොට ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම 115ඩී ගරාගොඩ ඉහළ වසමේ නැගෙනහිර මායිම ඡේදනයවන ලක්ෂය දක්වා ද; |
| | *බටහිර :* |
| | අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට අංක 115ඩී ගරාගොඩ ඉහල ග්‍රාම නිලධාරි වසමේ දකුණු හා බටහිර මායිම් ඔස්සේ නිරිත හා වයඹ දිශානුගතව අංක 115සී ගරාගොඩ පහළ වසම් මායිම ඡේදනය කරන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසම් මායිම ඔස්සේ වයඹ, බටහිර හා උතුරු දිශානුගතව අංක 106බී කබුළුමුල්ල ග්‍රාම නිලධාරි වසම් මායිම ඡේදනය කරන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකී වසම් මායිම ඔස්සේ බටහිර හා ඊසාන දිශානුගතව ආරම්භක ලක්ෂය තෙක් අඳින ලද රේඛාවෙන් ඇතුළත පිහිටියා වූ ප්‍රදේශය හා ග්‍රාම නිලධාරි වසම් අංක 108 න් දැක්වෙන්නා වූ උතුර, නැගෙනහිර, දකුණ, බටහිර මායිම් දක්වා ඇති මත්තමගොඩ ග්‍රාම නිලධාරි වසම. |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.